සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 06 - 2024

## නාට්‍ය හා රංග කලාව

කාලය පැය 02 යි

නම / විභාග අංකයඃ

### I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- පහත සඳහන් A,B,C,D,E කොටස් ඇසුරින් අංක 1 සිට 5 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A. ඇටිකිති චුස්
කකුළු චරස්
හාවා කළ එකල මෙකල

B. මී හාමිලා හතර දෙනයි
ඉන්න තැනක් උන්ට නැතෙයි
කන්න දෙයක් උන්ට නැතෙයි
බොන්න දෙයක් උන්ට නැතෙයි

C. "කැත්තක් අරගෙන වත්තට යනකොට
පෙත්තෙක් ඉඳගෙන කජු කනවා
ලංසි පැටව් මුහුදු යන්න නැවක් හදනවා
තක දොං නැවක් හදනවා"

D. "කරගල ගඟා එනවා මම නොදනිම් ද?"

E. "මෙන්න මේ බෙලි ගෙඩිය ඔය පේන වේලිච්ච තල් අත්ත උඩට වැටුණු වේලාවේ ඇති වෙච්ච සද්දෙට තමයි අපේ මේ හා පැංචා කලබල වෙලා තියෙන්නේ. "

01. ළමා නාට්‍යයක සංවාදයක් අන්තර්ගත වන්නේ,
 1. A  2. B  3. C  4. D

02. "අනුන්ට කැපූ වලේ තමන් වැටීම" ජන කතාවට අදාළ වන්නේ,
 1. D  2. E  3. B  4. A

03. රබන් පදයක් අන්තර්ගතව ඇත්තේ,
 1. E  2. D  3. B  4. C

04. "හේතුව නොදැන කලබල වීම නිෂ්ඵල කාරණයකි" යන ආදර්ශය ලබා දෙන්නේ,
 1. A  2. D  3. E  4. C

05. ජන කථාවකට අයත් වන්නේ,
 1. C  2. A  3. B  4. E

- ප්‍රශ්න අංක හයේ සිට දහය දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරන්න.

06. එදිනෙදා සමාජයේ ඔබට හමුවන මිනිස් චරිතයක් නොවන්නේ,
 1. වෛද්‍යවරයා  2. දෙවියා  3. හමුදා සෙබලා  4. මාළු වෙළෙන්දා

07. අධි මානුෂ චරිතයක් නොවන්නකි,
 1. රොබෝවරයා  2. යෝධයා  3. සුරංගනාවිය  4. ක්‍රීඩකයා

08. යම් චරිතයක ස්වරූපය ඒ අයුරින් ම කර පෙන්වීම,

1. අනුකරණය යි. 2. සමාරෝපය යි. 3. සතර අභිනය යි. 4. රඟපෑමයි.

09. නාට්‍යෝපකරණයක් නොවන්නේ,

1. පුටුව 2. බටනළාව 3. මාළිගාව 4. හැරමිටිය

10. ස්වභාවික පරිසරය ආශ්‍රිත සංසිද්ධියක් නොවන්නේ,

1. මල් පිපීම 2. අහස කළු වීම 3. වාහන වලින් නැගෙන දුම 4. කුරුල්ලන් පියෑඹීම

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරන්න.**

(එක්ස් රේ කොළය, රබන් පද, ස්වශන අභ්‍යාසවල, නාට්‍යක, කතන්දරය)

11. ශ්‍රාවකයා අරමුණු කරගත් අසා රසවිඳිය හැකි මාධයකි ................................................

12. ........................................... සංවාද හා රංගවිධාන සහිතව ලියන ලද පිටපතක් ඇත.

13. හඬ පාලනය සඳහා ............................................... නිරත වීම අත්‍යවශ්‍ය වේ.

14. .................................................... කටහඬ අභ්‍යාස සඳහා භාවිත කළ හැකිය.

15. චණ්ඩ මාරුතයක ශබ්දය නිපදවීමට ................................................ යොදා ගත හැකිය.

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති ප්‍රකාශ හරි නම් (✓) ලකුණද, වැරදි නම් (×) ලකුණ ද යොදන්න.**

16. නාට්‍යකරණයේ දී පරිකල්පනය වැදගත් නොවන්නකි. (.......)

17. මංගල, අවමංගල්‍යය අවස්ථා ආදිය අපට දෛනික ජීවිතයේ දී හමුවේ. (.......)

18. පරිසරයේ ඇති වස්තු උපයෝගී කර ගනිමින් කතන්දර නිර්මාණය කළ හැකිය. (.......)

19. නාට්‍යය යනු ශ්‍රව්‍ය මාධ්‍යයකි. (.......)

20. සමාජ ගැටලුවල ට විසඳුම් ජන කථා වලින් නිරූපණය කරයි. (.......)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න දෙකක් ඇතුළුව ප්‍රශ්න 3කට පිළිතුරු සපයන්න.

01. පාසලට යන එන
අතර මඟ දී කිසි තැන
කොලහල නොකරමින
ගමන් කරපන් සිල්වතෙකු මෙන.

1. මෙම කවිය අයත් ග්‍රන්ථය නම් කරන්න.
2. එම ග්‍රන්ථයේ කතුවරයා කවුද?
3. එම කෘතියේ ඇති වැදගත්කම කුමක් ද?
4. ඉහත කවියේ ඔබ හඳුනාගත් යහපත් සිරිත් දෙකක් ලියන්න.
5. මහලු වී සිටියත්
රුවින් අඩු වී සිටියත්
............................
............................
ඉතිරි කවි පද දෙක සම්පූර්ණ කරන්න. (ලකුණු 2×5 = 10)

02) 1. ඔබ දන්නා ජන කතන්දර දෙකක් සහ වේදිකා නාට්‍ය දෙකක් නම් කරන්න. (ලකුණු 02)
2. වේදිකා නාට්‍යයක් යනු කුමක්ද? කෙටියෙන් පහදන්න. (ලකුණු 03)
3. වේදිකා නාට්‍යයක් සහ කතන්දරයක දක්නට ලැබෙන සමානතා සහ අසමානතා දෙක බැගින් ලියන්න. (ලකුණු 05)

03) 1. අධි මානුෂ චරිතයක් යනු කුමක් දැයි හඳුන්වන්න. (ලකුණු 02)
2. ඔබ දන්නා මානුෂ චරිත 2ක් සහ අධි මානුෂ චරිත 2ක් සඳහන් කරන්න. (ලකුණු 04)
3. මානුෂ හා අධි මානුෂ චරිත අතර ඇති වෙනස්කම් දෙකක් ලියා දක්වන්න. (ලකුණු 04)

04) 1. නාට්‍යෝපකරණය යනු මොනවාද? කෙටියෙන් පහදන්න. (ලකුණු 03)
2. රජතුමා, ගොවියා සහ වෛද්‍යවරයා යන චරිත සඳහා යොදා ගත හැකි නාට්‍යෝපකරණ 1 බැගින් ලියන්න. (ලකුණු 03)
3. නාට්‍යෝපකරණ භාවිතයෙන් රංගනයට ඇති වන වාසි 2ක් ලියන්න. (ලකුණු 04)

05) 1. මිනිසා තුළ හට ගන්නා හැඟීම් දෙකක් ලියන්න. (ලකුණු 02)
2. වැලි පිරවූ බිස්කට් ටින් එකකින් සහ පොල් කටු දෙකක් භාවිතයෙන් නිර්මාණය කර ගත හැකි ශබ්ද (හඬ) 3ක් නම් කරන්න. (ලකුණු 03)
3. පරිසරය තුළින් ඔබ ශ්‍රවණය කරන ස්වභාවික ශබ්ද සහ කෘතිම ශබ්ද 2 බැගින් ලියා දක්වන්න. (ලකුණු 05)

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවProvincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 06 - 2024

# නාට්‍ය හා රංග කලාව

නම / විභාග අංකයඃ

### ප්‍රායෝගික පරීක්ෂණය

01) ඔබ කැමතිම නාට්‍ය ගීතයක් ගයමින් රංගනය කරන්න. (ලකුණු 15)

02) පහත සඳහන් චරිත අතුරින් ඔබ කැමති චරිතයක් තෝරා ගෙන නිරූපණය කරන්න.

මසුරු වෙළෙන්දෙක්
හොර වෙළෙන්දෙක්
කපටි හිඟන්නෙක්
සාස්තරකරුවෙක්
පිස්සු චරිතයක් (ලකුණු 10)

03) පහත සඳහන් වාක්‍ය වලින් එකක් තෝරාගෙන විවිධ අර්ථ තුනකට උච්චාරණය කරන්න.

මේ මොකෙක් ද?
මට යන්න දෙන්න.
අන්න අර කව්ද?
අපි මොකද කරන්නේ.
ම් ම් ............ රසයි. (ලකුණු 05)

04) කණ්ඩායම් ක්‍රියාකාරකම් (ක්ෂණික නිරූපණ)

පන්තියට නයෙක් ඇවිල්ලා.
මඩ වලක මලක් පිපිලා.
බල්ලෙකුට මස් කට්ටක් ලැබිලා.
අල්ලපු වත්තේ කොස් ගහේ වරකයක් ඉදිලා.
පාසැල් ඇරී යන විට මහ වැස්සකට හසු වීම. (ලකුණු 10)

05) කතාන්දර ඉදිරිපත් කිරීම. (ලකුණු 10)